# PRODUCTION COST & MARKET STRUCTURES (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතන

සමජාතීය භාණ්ඩ නිපදවීමත් එක් ආයතනයක් මුළු වෙළෙඳපොළ සැපයුමෙන් ඉතා සුළු කොටසක් පමණක් නිෂ්පාදනය කරන නිසාත් පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් **මිල ගනුවකු** ( Price Taker) ලෙස සැලැකේ.

# පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය

මිලට බලපෑමක් නොකර වෙළෙඳපොළ පවතින මිලට ඕනෑම ප්‍රමාණයක් අලෙවි කර ගත හැකි නිසා පූර්ණ තරගකාරී ආයතනයක **ඉල්ලුම් වක්‍රය පහත පරිදි තිරස් අක්ෂයට සමාන්තර වූ සරල රේඛාවක ආකාරයට පිහිටයි.**




ආයතනය ඉල්ලුම් වක්‍රය


Class Work.LK

# පූර්ණ තරගකාරී කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය

පූර්ණ තරගකාරී ආයතනයක් මිල ගනුවකු වුව ද පූර්ණ තරගකාරී කර්මාන්තයට භාණ්ඩයක මිල තීරණය කිරීමට හැකි ය.

මේ නිසා පූර්ණ තරගකාරී කර්මාන්තයේ **ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වන්නකි.**

එය පහත පරිදි දැක්විය හැකි ය.





පූර්ණ තරගකාරී කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය


ClassWork.LK

# පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා පූර්ණ තරගකාරී කර්මාන්තයක ඉල්ලුම් වක්‍රය අතර සම්බන්ධතාව

පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා පූර්ණ තරගකාරී කර්මාන්තයක ඉල්ලුම් වක්‍රය අතර සම්බන්ධතාවක් පවතී. මෙම සම්බන්ධතාව පහත පරිදි දැක්විය හැකි ය.




(**A**) රූපසටහන




(**B**) රූපසටහන

ClassWork.LK

ඉහත (A) රූප සටහනේ $D_M$ වක්‍රයෙන් කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රයත්, $S_M$ වක්‍රයෙන් කර්මාන්තයේ සැපයුම් වක්‍රයත් දැක්වේ.

කර්මාන්තයේ තීරණය වී ඇති සමතුලිත මිල $P_0$ වේ.

ආයතනවල නිෂ්පාදිත මෙම $P_0$ මිලට අලෙවි කර ගත හැකි ය. මෙම නිසා ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය එකක් වන අතර (B) රූප සටහනේ D වක්‍රයෙන් එම ඉල්ලුම් වක්‍රය පෙන්නුම් කෙරේ.

ආයතන මුහුණ දෙන මිල වෙනස් වන්නේ කර්මාන්තයේ ඉල්ලුම සැපයුම වෙනස් වුව හොත් පමණි.

**නිදසුන් :**

කර්මාන්තයේ සැපයුම ස්ථාවර ව තිබිය දී ඉල්ලුම වැඩි වුව හොත් සමතුලිත මිල ඉහළ යයි. ඒ අනුව ආයතනවලට ලැබෙන මිල ද ඉහළ යයි.

ClassWork.LK

## පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයකට කෙටි කාලයේ දී මුහුණ දීමට සිදු වන සංරෝධක

- මිල ගනුවකු ලෙස කටයුතු කිරීමට සිදු වීම.
- ආයතනය සතුව පවතින තාක්ෂණය හා ධාරිතාව මත කටයුතු කිරීමට සිදු වීම.

ClassWork.LK

## මෙම සංරෝධක දෙක යටතේ කටයුතු කිරීමේදී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ගත යුතු වැදගත් තීරණ

- නිෂ්පාදනයේ තව දුරටත් රැඳී සිටිනවා ද? නො එසේ නම් ආයතනය වසා දමනවා ද ? යන්න
- නිෂ්පාදනයේ තව දුරටත් රැඳී සිටීමට තීරණය කළ හොත් කොපමණ භාණ්ඩ ප්‍රමාණයක් නිපදවනවා ද? යන්න

ClassWork.LK

# පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයට සිය ප්‍රශස්ත නිමැවුම තීරණය කිරීමට භාවිත කළ හැකි විශ්ලේෂණ ක්‍රම

ආයතනය වසා නො දමා තව දුරටත් නිෂ්පාදනයේ රැඳී සිටීමට තීරණය කළ හොත් පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයට සිය ප්‍රශස්ත නිමැවුම තීරණය කිරීමට භාවිත කළ හැකි විශ්ලේෂණ ක්‍රම 2 ක් ඇත.

- මුළු අයභාර - මුළු පිරිවැය ප්‍රවේශය

- ආන්තික අයභාර - ආන්තික පිරිවැය ප්‍රවේශය

ClassWork.LK

## මුළු අයභාර හා මුළු පිරිවැය ප්‍රවේශය

මුළු අයභාරය හා මුළු පිරිවැය ඇසුරින් ආර්ථික ලාභ ගණනය කොට ආර්ථික ලාභ වැඩි ම නිමැවුම ප්‍රශස්ත නිමැවුම ලෙස තෝරා ගැනීම මුළු අයභාර හා මුළු පිරිවැය ප්‍රවේශය මගින් සිදු කරයි.

## පූර්ණ තරගකාරී ආයතනයේ මුළු අයභාරය හෙවත් අලෙවි ආදායම

මුළු අයභාරය = භාණ්ඩයේ මිල x ප්‍රමාණය

$$TR = P \times Q$$

## පූර්ණ තරගකාරී ආයතනයේ කෙටි කාලීන මුළු පිරිවැය (TC)

මුළු ස්ථාවර පිරිවැය (TFC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) යන දෙකෙහි එකතුවෙන් කෙටි කාලීන මුළු පිරිවැය (TC) ලැබේ.

ClassWork.LK

# මුළු ආභාරය හා මුළු පිරිවැය ඇසුරෙන් ප්‍රශස්ත නිමැවුම තෝරා ගන්නා ආකාරය සංඛ්‍යා සටහන ඇසුරෙන්

| නිමැවුම (දිනකට ඒකක) | මුළු අයභාරය (රු.) | මුළු පිරිවැය (රු.) | ආර්ථික ලාභ (රු.) |
|---|---|---|---|
| 0 | 0 | 20 | -20 |
| 1 | 20 | 36.8 | -16.8 |
| 2 | 40 | 52.8 | -12.8 |
| 3 | 60 | 68.0 | -80 |
| 4 | 80 | 80.0 | 0 |
| 5 | 100 | 90.4 | 9.6 |
| 6 | 120 | 101.6 | 18.4 |
| 7 | 140 | 114.4 | 25.6 |
| 8 | 160 | 128.0 | 32.0 |
| 9 | 180 | 146.4 | 33.6 |
| 10 | 200 | 168.0 | 32.0 |
| 11 | 220 | 196.0 | 24.0 |
| 12 | 240 | 240.0 | 0 |

මෙහි දී වෙළෙඳපොළේ තීරණය වී ඇති භාණ්ඩ ඒකකයක මිල රුපියල් 20/- ලෙසින් සැලකිල්ලට ගෙන ඇත.


ClassWork.LK


සංඛ්‍යා සටහනට අනුව මුළු අයභාරයෙන් මුළු පිරිවැය අඩු කිරීමෙන් ආර්ථික ලාභ ලබා ගෙන ඇති අතර වැඩි ම ආර්ථික ලාභය රුපියල් 33.60 කි.

එම නිසා පූර්ණ තරගකාරී ආයතනය ආර්ථික ලාභය වැඩි ම නිමැවුම් මට්ටම වන නිමැවුම ඒකක 9 ප්‍රශස්ත නිමැවුමක් සේ තෝරා ගනී.

ClassWork.LK

**ඉහත සංඛ්‍යා ලේඛන සටහනේ දැක්වෙන තොරතුරු ප්‍රස්තාර සටහනක් මගින්**




ClassWo.k.LK

ඉහත ප්‍රස්තාර සටහනට අනුව a සහ b ලක්ෂ්‍යයන්හි දී මුළු අයභාර වක්‍රය මුළු පිරිවැය වක්‍රය ඡේදනය කරයි. ඒ අනුව a සහ b ලක්ෂ්‍යයන්හි දී ආර්ථික ලාභ ශුන්‍ය වේ.

a ලක්ෂයට පහළ කොටසේ දී මුළු අයභාර වක්‍රයට වඩා ඉහළින් මුළු පිරිවැය වක්‍රය ගමන් කරයි. එම ප්‍රදේශයේ දී ම ආර්ථික ලාභ ඍණ අගයක් ගනී.

b ලක්ෂයට ඉහළ කොටසේ දී මුළු අයභාර වක්‍රයට වඩා ඉහළින් මුළු පිරිවැය වක්‍රය ගමන් කරයි. එම ප්‍රදේශයේ ද ආර්ථික ලාභ ඍණ අගයක් ගනී.

a හා b අතර ප්‍රදේශයේ දී මුළු පිරිවැයට වඩා ඉහළින් මුළු අයභාර වක්‍රය ගමන් කරයි.

එම නිසා a හා b අතර ප්‍රදේශය ආර්ථික ලාභ සහිත ප්‍රදේශයක් වේ.

පූර්ණ තරගකාරී ආයතනය ආර්ථික ලාභ සහිත ප්‍රදේශයේ දී තම ප්‍රශස්ත නිමැවුම් මට්ටම වශයෙන් තෝරා ගන්නේ වැඩි ම ආර්ථික ලාභ පවතින අවස්ථාව යි.

රූප සටහනේ N – M දක්වා ලම්බක දුරෙන් වැඩිම ආර්ථික ලාභ දැක් වේ. ඒ අනුව රුපියල් 33.60 වැඩි ම ආර්ථික ලාභය යි.

ClassWork.LK

මේ නිසා වැඩි ම ආර්ථික ලාභ පවතින ඒකක 9 කෙටි කාලයේ දී ප්‍රශස්ත නිමැවුම් මට්ටම සේ තෝරා ගනී.

ClassWork.LK

# ආන්තික අයභාර - ආන්තික පිරිවැය (MR=MC) ප්‍රවේශය

ආන්තික අයභාර = ආන්තික පිරිවැය ( **MR=MC** ) ප්‍රවේශයේ දී නිෂ්පාදන ආයතනයේ ආන්තික අයභාරය හා ආන්තික පිරිවැය පදනම් කර ගෙන ලාභ ගණනය කිරීම සිදු වේ. ඒ අනුව යම් අවස්ථාවක ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන නිමැවුම් මට්ටම ප්‍රශස්ත නිමැවුම සේ තෝරා ගනී.

## ආන්තික අයභාරය

නිමැවුම එක් ඒකකයකින් වැඩි කරන විට ආයතනයේ මුළු අයභාරයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික අයභාරය යි.

මුළු අයභාරයේ වෙනස නිමැවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික අයභාරය ලබා ගත හැකි ය.

ආන්තික අයභාරය = මුළු අයභාරයේ වෙනස - නිමවුමේ වෙනස

ClassWork.LK

ආන්තික අයභාරය = මුළු අයභාරයේ වෙනස - නිමවුමේ වෙනස

$$AVC = \frac{\Delta TR}{\Delta Q}$$

නිමවුම (Q) (ඒකක)

$$\left.\begin{matrix} 10 \\ 12 \end{matrix}\right\rangle 2$$

මුළු අයභාරය (රු.) (TR)

$$\left.\begin{matrix} 100 \\ 200 \end{matrix}\right\rangle 2$$

$$MR = \frac{100}{2}$$

= රුපියල් 50.00

ClassWork.LK

# ආන්තික පිරිවැය

නිමැවුම එක් ඒකකය බැගින් වැඩි කරන විට මුළු පිරිවැයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික පිරිවැය යි.

මුළු පිරිවැයේ වෙනස නිමැවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික පිරිවැය ලබා ගත හැකි ය.

| |
|---|
| ආන්තික අයභාරය = මුළු පිරිවැයේ වෙනස - නිමවුමේ වෙනස |

$$MC = \frac{\Delta TC}{\Delta Q}$$

| නිමවුම (Q) (ඒකක) | | මුළු අයභාරය (රු.) (TR) | |
|---|---|---|---|
| 20 | 20 | 300 | 200 |
| 30 | | 500 | |

$$MC = \frac{200}{10}$$

= රුපියල් 20.00

= ඒකක 25

Class Work.LK

පූර්ණ තරගකාරී ආයතනයකට පැවරුණු මිලක් යටතේ කටයුතු කිරීමට සිදුවන නිසා පූර්ණ තරගකාරී ආයතනයක මිල සාමාන්‍ය අයභාරයට සහ ආන්තික අයභාරයට සමාන (**P=AR=MR**) වේ.

මෙය පහත සංඛ්‍යා නිදසුන ඇසුරින් ලෙස පැහැදිලි කළ හැකි ය.


එහි දී භාණ්ඩයේ මිල රුපියල් 25 ලෙසින් සැළකිල්ලට ගෙන ඇත.

| ප්‍රමාණය (Q) | මිල (P) | මුළු අයභාරය (TR) | සාමාන්‍ය අයභාරය (AR) | ආන්තික අයභාරය (MR) |
|---|---|---|---|---|
| 0 | 25 | 0 | 0 | - |
| 1 | 25 | 25 | 25 | 25 |
| 2 | 25 | 50 | 25 | 25 |
| 3 | 25 | 75 | 25 | 25 |
| 4 | 25 | 100 | 25 | 25 |
| 5 | 25 | 125 | 25 | 25 |

මිල රුපියල් 25ක් සේ ස්ථාවර ව පවත්නා බැවින් එය සාමාන්‍ය අයභාරයට සහ ආන්තික අයභාරයට සමාන වේ.

ClassWork.LK

පූර්ණ තරගකාරී ආයතනයේ මිල = සාමාන්‍ය අයභාරය = ආන්තික අයභාරය (P = AR =MR) වන බැවින් එම තත්ත්වය පහත ආකාරයට ප්‍රස්තාර සටහනක් මගින් දැක්විය හැකි ය.




ClassWork.LK

# පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් සමතුලිතතාවට පත්වෙමින් ප්‍රශස්ත නිමැවුම තෝරා ගන්නා ආකාරය


කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන විට දී සමතුලිතතාවට පත්වෙමින් ප්‍රශස්ත නිමැවුම තෝරා ගන්නා ආකාරය පහත පරිදි සංඛ්‍යා සටහනක් හා ප්‍රස්තාර සටහනක් ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.

| නිමැවුම (Q) | මුළු අයභාරය (TR) | මුළු පිරිවැය (TC) | ආන්තික අයභාරය (MR) | ආන්තික පිරිවැය (MC) | ආර්ථික ලාභය (TR - TC) |
|---|---|---|---|---|---|
| 6 | 120 | 101.6 | | 12.8 | 18.4 |
| 7 | 140 | 114.4 | 20 | 13.6 | 25.6 |
| 8 | 160 | 128.0 | 20 | 18.4 | 32.0 |
| 9 | 180 | 146.4 | 20 | 20 | 33.6 |
| 10 | 200 | 168.0 | 20 | 21.6 | 32.0 |
| 11 | 220 | 196 | 20 | 28.0 | 24.0 |

සංඛ්‍යා සටහනට අනුව නිමැවුම ඒකක 9 දී ආර්ථික ලාභය උපරිම වේ. එහි දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වේ.

ClassWork.LK

එම නිසා පූර්ණ තරගකාරී ආයතනය නිමැවුම් ඒකක 9 ප්‍රශස්ත නිමැවුම් මට්ටම සේ තෝරා ගනී. ආන්තික අයභාර = ආන්තික පිරිවැය( **MR=MC** ) කොන්දේසිය තෘප්ත කරමින් ලාභ උපරිම කරන ප්‍රශස්ත නිමැවුම් මට්ටම පහත ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.




රූප සටහනට අනුව A ලක්ෂ්‍යයේ දී ආන්තික අයභාර = ආන්තික පිරිවැය (MR = MC) වේ. එම අවස්ථාවේ දී ආර්ථික ලාභ ද උපරිම වන අතර ප්‍රශස්ත නිමැවුම ඒකක 9 කි.

රූප සටහනේ දක්වෙන K ලක්ෂ්‍යයේ දී ආන්තික අයභාර = ආන්තික පිරිවැය (MR = MC) කොන්දේසිය තෘප්ත වුවත් ඊට අදාළ නිමැවුම ප්‍රශස්ත නිමැවුම සේ තෝරා නො ගනී.

ClassWork.LK

ඊට හේතුව K ලක්ෂ්‍යයට අදාළ නිමැවුම් මට්ටමේ දී කිසිදු ලාභයක් නොලැබේ. නිමැවුම ප්‍රසාරණය කළහොත් ලාභ හට ගනී. ලාභ උපරිම වීම සඳහා ආන්තික අයභාරය = ආන්තික පිරිවැය (MR = MC) යන කොන්දේසිය ඉටු වීම පමණක් ප්‍රමාණවත් නොවේ. මේ සඳහා තවත් කොන්දේසියක් ඉටු විය යුතුය.

එනම් ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන (MR = MC) ලක්ෂ්‍යයේ දී ආන්තික පිරිවැය ( MC) වක්‍රය ආන්තික අයභාර (MR ) වක්‍රය ඡේදනය කළ යුත්තේ ඉහළ සිට පහළින් නොව පහළ සිට ඉහළිනි. එනම් ආන්තික පිරිවැය (MC) වක්‍රයේ බෑවුම ධන අගයක් විය යුතු ය.

ClassWork.LK

# පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන හැසිරීම තුළ මුහුණ දිය හැකි විකල්ප අවස්ථා කිහිපයකි

- ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම (නිෂ්ප්‍රාමාණික ලාභ / අතිප්‍රාමාණික ලාභ)

- ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ නිෂ්පාදනයේ යෙදීම (ප්‍රාමාණික ලාභ)


- පාඩු ලැබීම (අවප්‍රාමාණික ලාභ)/පාඩු ලබමින්) නිෂ්පාදනයේ යෙදී සිටීම

- නිෂ්පාදන ආයතනය වසා දැමීම

# ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටින අවස්ථාවේ දී මිල සාමාන්‍ය පිරිවැය ඉක්මවා යන අතර මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා යයි.

පහත රූප සටහනේ දැක්වෙන්නේ මෙවැනි නිෂ්ප්‍රාමාණික ලාභ ලබන තත්ත්වයකි.




ඉහත රූප සටහනට අනුව ආන්තික අයභාරය = ආන්තික පිරිවැය (MR = MC) යන කොන්දේසිය තෘප්ත කරමින් a ලක්ෂ්‍ය දී ආයතනය සමතුලිතතාවට පත් අතර ඊට අදාළ නිමැවුම මට්ටම ඒකක 9ක් වේ.

ClassWork.LK

එම අවස්ථාවේ දී පූර්ණ තරගකාරී ආයතනයේ මුළු අයභාරය මුළු පිරිවැය හා ආර්ථික ලාභය පහත පරිදි වේ.

මුළු අයභාරය = සාමාන්‍ය අයභාරය × නිමැවුම් ඒකක ප්‍රමාණය

TR = AR × Q

TR = 20 × 9

TR = රුපියල් 180

මුළු පිරිවැය = සාමාන්‍ය පිරිවැය × නිමැවුම් ඒකක ප්‍රමාණය

TC = ATC × Q

TC = 12 × 9

TC = රුපියල් 108

ආර්ථික ලාභය = මුළු අයභාරය - මුළු පිරිවැය

= TC –TC

= 180 × 108


TC = රුපියල් 72

ClassWork.LK

## ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ නිෂ්පාදනයේ යෙදීම

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ප්‍රාමාණික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටින අවස්ථාවේ දී මිල සාමාන්‍ය පිරිවැයට සමාන වන අතර මුළු අයභාරය ද මුළු පිරිවැයට සමාන වේ.

**පහත රූප සටහනෙහි පෙන්නුම් කෙරෙන්නේ එවැනි ප්‍රාමාණික ලාභ ලබන තත්වයකි.**




ClassWork.LK

ඉහත රූප සටහනෙහි a ලක්ෂ්‍යයෙන් සමතුලිත අවස්ථාව දැක්වෙන අතර ඊට අදාළ නිමැවුම ඒකක 9 වේ.

මෙම අවස්ථාවේ දී ආයතනයේ මුළු අයභාරය මුළු පිරිවැය සහ ආර්ථික ලාභ තත්ත්ව පහත පරිදි වේ.

මුළු අයභාරය $= 20 \times 9$

$=$ රුපියල් 180

මුළු පිරිවැය $= 20 \times 9$

$=$ රුපියල් 180


ආර්ථික ලාභ $= 0$

ClassWork.LK

# පාඩු ලැබීම (අවප්‍රාමාණික ලාභ)/පාඩු ලබමින්) නිෂ්පාදනයේ යෙදී සිටීම

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක භාණ්ඩ ඒකකයක සාමාන්‍ය පිරිවැය භාණ්ඩ ඒකකයක මිල ඉක්මවා යන අවස්ථාවේ දී පාඩු ලැබීම සිදු වේ. මෙහි දී මුළු අයභාරයට වඩා මුළු පිරිවැය වැඩි වන නිසා ආයතනයට අවප්‍රාමාණික ලාභ හිමි වේ.

පහත රූප සටහනෙහි පෙන්නුම් කෙරෙන්නේ එවැනි පාඩු (අවප්‍රාමාණික ලාභ) ලබන තත්වයකි.




මුළු අයභාරය = 20 × 9= රුපියල් 180
මුළු පිරිවැය = 25 × 9 = රුපියල් 225
අවප්‍රමාණික ලාභ = 180-225
= රුපියල - 45

රූප සටහනේ අඳුරු කළ කොටසේ ක්ෂේත්‍රඵලයෙන් දැක්වෙන්නේ මෙම අවප්‍රාමාණික ලාභ ප්‍රමාණය යි.

ClassWork.LK


# නිෂ්පාදන ආයතනය වසා දැමීම

කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් අවප්‍රමාණික ලාභ ලැබු ව ද නිෂ්පාදන ආයතනය වසා නොදමා නිෂ්පාදනයේ නිරත වීමට තීරණය කළ හැකි ය. එසේ තීරණය කරනුයේ නිෂ්පාදනයේ නිරත වීමෙන් ස්ථාවර පිරිවැයෙන් කිසියම් ප්‍රමාණයක් හෝ පියවා ගැනීමට ඉඩ සැලසේ නම් පමණි.

කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයකට මුළු ස්ථාවර පිරිවැය නියත වශයෙන් දැරීමට සිදුවන පිරිවැයක් වන අතර, මුළු විචල්‍ය පිරිවැය වළක්වා ගත හැකි පිරිවැයක් වේ.

ආයතනයේ මුළු අයභාරයෙන් මුළු පිරිවැය පියවා ගැනීමට නොහැකි වූවත් මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය පියවා ගැනීමට හැකියාවක් පවතී නම් පාඩු ලබන තත්ත්වයක වුව ද නිෂ්පාදනයේ යෙදෙමින් කර්මාන්තයේ තවදුරටත් රැඳී සිටීමට ආයතනය කටයුතු කරයි. පහත රූප සටහනින් මෙම තත්ත්වය තව දුරටත් පැහැදිලි කළ හැකි ය.

ClassWork.LK




ඉහත රූප සටහනට අනුව a ලක්ෂ්‍යයෙන් දැක්වෙන සමතුලිත අවස්ථාවේ දී ආයතනයේ මුළු අයභාරය මුළු විචල්‍ය පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත් වේ.

**a** ලක්ෂ්‍යයේ දී මුළු අයභාරය **= 15 × 8**

**=** රුපියල් **120**

**a** ලක්ෂ්‍යයේ දී මුළු විචල්‍ය පිරිවැය **= 15 × 8**

**=** රුපියල් **120**

ClassWork.LK

**b** ලක්ෂ්‍යයේ දී පාඩු ලැබුව ද මුළු විචල්‍ය පිරිවැයට වඩා මුළු අයභාරය වැඩි ය.

**b** ලක්ෂ්‍යයේ දී මුළු අයභාරය **= 20 × 11 =** රුපියල් 220

**b** ලක්ෂ්‍යයේ දී මුළු විචල්‍ය පිරිවැය **= 17 × 11 =** රුපියල් **187**

**b** ලක්ෂ්‍යයේ දී මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය පියවීමෙන් පසු තව රුපියල් 33ක් (220 - 187) ඉතිරි වේ.

එම ඉතිරි කොටසින් ස්ථාවර පිරිවැයෙන් කොටසක් හෝ පියවීමට ද ආයතනයට යොදා ගත හැකි ය. මෙම නිසා පාඩු ලබන තත්ත්වයක වුව ද කෙටි කාලයේ දී නිෂ්පාදනයේ යෙදෙමින් කර්මාන්තයේ තවදුරටත් රැඳී සිටීමට ආයතනය කටයුතු කරයි.


රූප සටහනේ දක්වෙන පරිදි **a** ලක්ෂ්‍යය ට පහළ ලක්ෂ්‍යවලට අදාළ සමතුලිත අවස්ථාවල දී ආයතනයේ මුළු අයභාරයෙන් මුළු විචල්‍ය පිරිවැය පියවා ගැනීමට නොහැකි නිසා නිෂ්පාදනය අත්හිටුවීම තාර්කික ය.

ClassWork.LK

ඉහත රූප සටහනින් හෙළි වන සමස්ත තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක නිෂ්පාදනයේ රැඳී සිටිනවා ද අත් හිටුවනවා ද යන්න තීරණය කෙරෙන තීරණාත්මක ලක්ෂ්‍යය වන්නේ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන a ලක්ෂ්‍යය යි .


ClassWork.LK

# පූර්ණ තරගකාරී ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය




ඉහත රූප සටහනෙහි $a_0$ ලක්ෂ්‍යයේ දී මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන නිසා $a_0$ ලක්ෂ්‍යයන් ඉහළ පිහිටි MC වක්‍රය ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය වේ.

ClassWork.LK




පූර්ණ තරගකාරී ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය

ClassWork.LK

## පූර්ණ තරගකාරී කර්මාන්තයේ සමතුලිතතාව

පූර්ණ තරගකාරී කර්මාන්තයේ සමතුලිතතාව ඇති වන්නේ කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය කර්මාන්තයේ සැපයුම් වක්‍රය ඡේදනය වන ලක්ෂ්‍යයේ දී ය.

## පූර්ණ තරගකාරී කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය

පූර්ණ තරගකාරී කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය භාණ්ඩය සඳහා අදාළ වෙළෙඳපොළේ සියලු ම පෞද්ගලික ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් ලබා ගන්නකි.

ඒ අනුව පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වන්නකි.

## පූර්ණ තරගකාරී වෙළෙඳපොළ සැපයුම වක්‍රය

පූර්ණ තරගකාරී වෙළෙඳපොළ සැපයුම වක්‍රය ලබා ගන්නේ ආයතනවල සැපයුම් වක්‍රවල තිරස් එකතුවෙනි.


ඒ අනුව පූර්ණ තරගකාරී ආයතන සියල්ල ම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රවල තිරස් එකතුවෙන් වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කර ගත හැකි ය.

ClassWork.LK

නිදසුන් ලෙස පූර්ණ තරගකාරී වෙළඳපොළේ ආයතන 100ක් පවතී නම් වෙළඳපොළෙහි සැපයුම් තත්ත්ව හා ඊට අදාළ වෙළෙඳපොළ සැපයුම් වක්‍රය පහත පරිදි ව්‍යුත්පන්න කර ගත හැකි ය.

| මිල (රු.) | එක් ආයතනයක සැපයුම (ඒකක) | වෙළෙඳපොළ සැපයුම (ඒකක) |
|---|---|---|
| 15 | 12 | 1200 |
| 20 | 13 | 1300 |
| 25 | 14 | 1400 |


ඉහත තොරතුරුවලට ආදාළ වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ප්‍රස්ථාර සටහනින්,




ClassWork.LK

# පූර්ණ තරගකාරී කර්මාන්තයේ සමතුලිතය තීරණය වන ආකාරය ප්‍රස්තාර සටහනින්

පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය පදනම් කර ගෙන පූර්ණ තරගකාරී කර්මාන්තයේ සමතුලිතය තීරණය වන ආකාරය ප්‍රස්තාර සටහනින් පහත පරිදි දැක්විය හැකිය.




ClassWork.LK

ඉහත රූප සටහනේ කර්මාන්තයේ ඉල්ලුම වක්‍රය $D_M$ වක්‍රයෙන් ද කර්මාන්තයේ සැපයුම $S_M$ වක්‍රයෙන් ද දැක්වේ.

එම ඉල්ලුම සහ සැපයුම මත කර්මාන්තයේ සමතුලිතය තීරණය වේ.

එලෙස තීරණය වූ සමතුලිත මිල රුපියල් 20 වන අතර සමතුලිත ප්‍රමාණය ඒකක 1300 වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura